**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.14 පැය 2200 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/736/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**බාල වයස්කාර දරුවෙකු ගොඩනැගිල්ලකින් පැනීම හේතුවෙන් තුවාල ලැබීම - කෙසෙල්වත්ත පොලිස් වසම.**

2025.04.13 වන දින දහවල් කාලයේදී කෙසෙල්වත්ත පොලිස් වසමේ පීර් සයිබු වීදියේ නිවසක දෙවන මහලින් පහළට පැන දරුවෙකු තුවාල ලැබීමේ සිද්ධියක් සම්බන්ධයෙන් කෙසෙල්වත්ත පොලිසිය මඟින් විමශර්න ආරම්භ කර ඇත.

**සිද්ධියෙන් බරපතල තුවාල ලැබූ වයස අවුරුදු 12 ක් වන කොළඹ 12 ප්‍රදේශයේ පදිංචි දරුවා මේ වන විට කොළඹ රිජ්වේ ආයර්ා ළමා රෝහලේ ප්‍රතිකාර ලබයි.**

මෙම දරුවා 2025.04.13 වන දින සිය නිවසේ සිට ඔහුගේ නිවස ආසන්නයේ පදිංචි කුඩා දරුවන් දෙදෙනෙකු සමඟ පීර් සයිබු වීදියේ වෙළඳසැලකට පැමිණි අවස්ථාවේ එම වෙළඳසැල ආසන්නයේ පිහිටි තෙමහල් නිවසක යකඩ ගේට්ටුවට මෙම දරුවා තට්ටු කර ඇති බවත් එයට උරණ වූ නිවසේ පදිංචි පුද්ගලයෙකු ඉහත දරුවා බලහත්කාරයෙන් නිවස තුලට ඔසවාගෙන ගොස් දෙවනි මහලේ කාමරයකට දමා සිර කර ඇති බවට අනාවරණය වී ඇති අතර එහිදී බියට පත්වූ දරුවා එම කාමරයේ ජනේලයක් විවෘත කරගෙන බිමට පැනීම හේතුවෙන් බරපතල තුවාල ලබා ඇති බවට දැනට සිදු කරන ලද වැඩිදුර විමශර්නයේදී අනාවරණය වී ඇත.

සිද්ධියට සම්බන්ධ ප්‍රධාන සැකකරු මේ වන විට ප්‍රදේශයෙන් පලා ගොස් ඇති අතර මෙම අපරාධයට ආධාර අනුබල දුන් **වයස අවුරුදු 59 ක් වන කොළඹ 12 ප්‍රදේශයේ පදිංචි සැකකරුවෙකු පොලිස් අත්අඩංගුවට ගෙන ඇති අතර** සිද්ධිය සම්බන්ධයෙන් කෙසෙල්වත්ත පොලිසිය වැඩිදුර විමශර්නය කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**